**නුවරඑළිය මහා නගර සභාව - 2021**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

නුවරඑළිය මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ඉදිරි වර්ෂයේදී ගෙවිය යුතු රු.10,592,134 ක් ජංගම බැරකම් යටතේ ශේෂ පත්‍රයේ දැක්විය යුතු වුවද, ගෙවිය යුතු සම්පූර්ණ මුදල වන රු.18,336,366 ක මුදල දිගු කාලීන වගකීම් ලෙසට දක්වා තිබුණි. | විගණනය විසින් පෙන්වා දුන් පරිදි ඉදිරි වර්ෂයේදී පොදු ගිණුම්කරණ මූලධර්ම වලට අනුව කටයුතු කරන බව දන්වා සිටින අතර, එහිදී අදාළ නිවැරදි කිරීම් සිදු කරන බව දන්වා ඇත. | ණය ප්‍රාග්ධන දිගු කාලීන සහ කෙටි කාලීන ලෙස හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | පරිත්‍යාග ලෙසට සභාවට ලැබී තිබුණු මෝටර් වාහන 17 ක සහ ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබුණු වාහන 03 ක අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | තක්සේරුවක් ලබා ගැනීමට යාන්ත්‍රික ඉංජිනේරු දැනුවත් කර තක්සේරු දෙපාර්තමේන්තුවෙන්ද තක්සේරුවක් ලබාදෙන ලෙස ඉල්ලා ඇති බව දන්වා ඇත. | තක්සේරු කර වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල අවස්ථා 07 කට අදාළව රු.10,675,357 ක අඩුවෙන් දැක්වීම්ද, අවස්ථා 02 කට අදාළව රු.252,975 ක වැඩියෙන් දැක්වීම්ද පැවතුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනයේ නිවැරදි කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඈ) | ශේෂ පත්‍රයේ ආපසු ගෙවිය යුතු තැන්පතු යටතේ දැක්විය යුතු මුද්දර ගාස්තු රු.196,124 ක් ණයහිමියන් ලෙසට දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බැවින් ඉදිරි වර්ෂයේදී අවසන් ගිණුම සකස් කිරීමේදී විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි කටයුතු කරනු ලබන බව දන්වා ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතුය. |

## 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 ක මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබු ශේෂ හා උපලේඛනවල සඳහන් ශේෂ අතර රු.3,450,135 ක නොසැසඳීමක් පැවතුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වා ඇත. | ගිණුම් ශේෂවල වෙනස්කම් සම්බන්ධයෙන් සොයා බලා අදාළ උපලේඛන හෝ මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුය. |

## 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| වියදම් ප්‍රතිපූර්ණය මත ගෙවීම්. | 531,497 | වියදමට අදාළ වවුචර්පත්, රිසිට්පත්, ගිවිසුම් | තවදුරටත් පරීක්ෂා කර බලා ඉදිරියේදී විගණනය වෙත කරුණු ඉදිරිපත් කරන බව දන්වා ඇත. | ගනුදෙනු වලට අදාළ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2015 ජූලි 14 දිනැති අංක 2015/03 රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධනය කරන ලද මුදල් රෙගුලාසි 371 (2) (ආ) සහ එම චක්‍රලේඛයේ 05 ඡේදය | ලබාගන්නා ලද අග්‍රිමය ලබාගත් කාර්යය අවසන්වී දින 10 ක් ඇතුළත හෝ කාර්යය අවසන් වූ වහාම නැවත පියවිය යුතු වුවද, වසර 05 සිට වසර 08 ක කාල පරාසයක සිට මහා නගර සභාවේ විවිධ වැඩසටහන් පැවැත්වීම, මිළදී ගැනීම් හා සුළු මුදල් අත්තිකාරම් ලෙස ලබාගෙන මුදල් නොපියවූ රු. 1,214,500 ක අත්තිකාරම් ශේෂ 09 ක් පැවතුණි . | වගකිව යුතු නිළධාරීන් සම්බන්ධයෙන් චෝදනා කෙටුම්පත් කර පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බව දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.130,904,874 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 125,474,515 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| i. | වර්ෂයේ බිල්කළ වරිපනම් ආදායමෙන් රු.31,367,682 ක්ද, ආරම්භක හිඟ වරිපනම් බදුවලින් රු.59,344,072 ක්ද, ලෙස වරිපනම් ඒකක 6418 කින් වරිපනම් බදු අය වීමටද පැවතියද අය කිරීම් ප්‍රගතිය ප්‍රමාණවත් මට්ටමක නොතිබුණි. | 2022 අගෝස්තු 10 දිනවන අවසන් රතු නිවේදන නිකුත් කර ඇති බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |
| (ආ) | කුලී | | |
| | කඩකුලී රු.6,501,810 ක් වසර 05 සිට වසර 30 දක්වා දීර්ඝ කාලයක සිට කඩහිමියන් 45 දෙනෙකුගෙන් අයවිය යුතුව පැවතුණි . | වාස බද්ධ අවසන් කිරීමේ නිවේදන නිකුත් කර ඇති බවත් දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |
| (ඇ) | ජල ගාස්තු | | |
| | ජල පාරිභෝගිකයින් 15 දෙනෙකුගෙන් අයවිය යුතු රු.6,175,509 ක හිඟයක් පැවතුණි. | මාස තුනකට වඩා වැඩි කාලයක් රු.2,000 ට වඩා වැඩි හිඟයක් පවතින ජල සේවාවන් සඳහා 2021 වර්ෂයේ නොවැම්බර් මස සිට රතු නිවේදන යොමු කර ඇති බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |
| (ඈ) | වෙනත් ආදායම් | | |
| i. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුද්ගලයින් 35 දෙනෙකුගෙන් දේපල බදු රු.15,510,500 ක් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | නොපමාව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වාර්ෂික ඉඩම් බලපත්‍ර 481 කට අදාළව අයවිය යුතු රු.19,247,649 ක ආදායම් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | නොපමාව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |
| iii. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් බදු හිමියන් 184 දෙනෙකුගෙන් ඉඩම් බදු රු.16,878,328 ක් අයකර නොතිබුණි. | නොපමාව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |
| | වික්ටෝරියා උද්‍යානයේ නව ආපනශාලාව පවත්වාගෙන යාම වාර්ෂිකව සියයට 10 ක වැඩිවීමක් මත 2011 මාර්තු 15 දින සිට වසර 10 කට බදුදීමට 2011 පෙබරවාරි මස පැවති මහා සභාවකදී තීරණය කර තිබුණි. එම තීරණය අනුව මෙම ආපනශාලාව වාර්ෂිකව විවෘත ප්‍රසම්පාදන ක්‍රමවේදයකට පසුගිය වසර 10 තුළ බදුදී නොතිබුණි . මෙම බදුකරු රු.2,241,319 ක් 2017වර්ෂයේ ගෙවීම පැහැර හැර තිබුණද සභාව මෙම බදුකරුට එරෙහිව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නඩු පැවරීම සඳහා නීතිඥ මහතා වෙත ලිපි ගොනු ලබා දී ඇති බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |
| iv. | සභාවට අයත් බදු පදනම මත ලබා දී ඇති උඩුපුස්සැල්ලාව මාර්ගයේ ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානය වෙනුවෙන් 2018 හා 2019 වර්ෂ සඳහා පිළිවෙලින් රු.122,286 ක හා රු.598,125 ක බදු මුදල් අයකර නොතිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බවත් ඉදිරියේදී නිවැරදි කරන බවත් දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභාවට ගොඩනැගිලි ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා 2018 නොවැම්බර් 05 දින පැවති මුදල් කාරක සභා අනුමැතිය මත රාජ්‍ය සංස්ථාවකට, 2018 වර්ෂයේදී රු.1,525,000 ක මුදලක් ගෙවා තිබුණු අතර එයින් අදාළ භාණ්ඩ නොලැබීම මත රු.415,107 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටද නිරවුල් කරගෙන නොතිබුණි. | සංස්ථාව වෙතින් තවදුරටත් ලබා ගැනීමට භාණ්ඩ වටිනාකම රු.245,400 ක් පමණක් බවත් එය මෙම වසර තුළදී සභාව වෙත ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති, භාණ්ඩ ලද පසු පෙර ගෙවීම පියවීම් කර විගණනයට ඉදිරිපත් කරන බව දන්වා ඇත. | ගෙවූ මුදල් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

-------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අවශ්‍යතාවය පිළිබඳ සැලකිලිමත් නොවී රු. 1,393,220 ක ජල උපකරණ නිකුත් කිරීම් නොකර මාස 11 ක් හා අවුරුදු 4 මාස 8 ක කාලයක් ගබඩාවේ නිෂ්කාර්යයව රඳවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 26 දින ගබඩා භෞතික පරීක්ෂාවේදී රු.366,145 ක තොග ඌනතාවයක් පැවතුණි. | පවත්නා තත්ත්වයන් ඉදිරියේදී පරීක්ෂා කර බලා සෙමෙන් චලනය වන තොග සම්බන්ධව අධ්‍යයනය කොට, ආයතනයේ ඵලදායී ලෙස යොදා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඒ බව විගණනය වෙත ඉදිරිපත් කරන බව දන්වා ඇත. | ඌනතාවය සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය. |